සියලුම හිමිකම ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

41105

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. මෙම පත්‍රය සඳහා ලකුණු 40කි.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරින් ඔබ තෝරාගත් උත්තරයෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

(01) සිදුහත් කුමරු ළමා අවධියේ අභියෝග ඉතා සාර්ථකව ජයගත් අවස්ථාවක් වන්නේ,
(1) උපන් විගස පියවර තැබීමයි.
(2) පංචමහා විලෝකනය සිදු කිරීමයි.
(3) සියලු ශිල්ප ශාස්ත්‍ර මැනවින් හැදෑරීමයි.
(4) සක්විති රජකම ලබා ගැනීමයි.

(02) ගිහි පාර්ශවයෙන් භික්ෂූන්වහන්සේලාට ප්‍රධාන වශයෙන් ම උපකාර කළ යුත්තේ,
(1) වෙහෙර විහාර ඉදිකර දීමෙනි.
(2) මිල මුදල් ලබා දීමෙනි
(3) සිල් රැකීමෙනි.
(4) සිව්පසයෙන් සංග්‍රහ කිරීමෙනි.

(03) සමථ භාවනාව හඳුන්වන වෙනත් නමක් වන්නේ,
(1) සමාධි භාවනාව යන්නයි.
(2) ප්‍රඥා භාවනාව යන්නයි.
(3) විපස්සනා භාවනාව යන්නයි.
(4) ත්‍රිලක්ෂණ භාවනාව යන්නයි.

(04) ශීල සංවරයෙහි පිහිටා සමාධිය හා ප්‍රඥාව වඩන බුද්ධිමත් වූ, දක්ෂ වූ, කෙලෙස් නසන වීර්ය ඇති විදර්ශනා ප්‍රඥාවෙන් යුක්ත වූ තැනැත්තා
(1) ජීවිතයේ සියලු ගැටලු අවුල් කරගනී.
(2) ජීවිතයේ සියලු අවුල් නිරවුල් කර නිවන පසක් කරගනී.
(3) අඹු දරුවන් සමඟ ඉතා සැපවත් ජීවිතයක් ගත කරයි.
(4) ඉතා ධනවත් වේ.

(05) " උඩගු නොව මහණ " යන පාඨය තම පිවිසුම් දොරටුවෙහි ලියා තැබූ හිමියන්ගේ නාමය වන්නේ,
(1) හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි ය.
(2) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර හිමි ය.
(3) වාරියපොළ සුමංගල හිමි ය.
(4) මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි ය.

(06) ලොව අනුසෝතගාමී මිනිසුන්ගේ ස්වභාවය නම්,
(1) රාගයෙන් රාගයට ම ගමන් කිරීමයි.
(2) රාගයෙන් විරාගයට ගමන් කිරීමයි.
(3) කෙලෙස්වලින් මිදීමට උත්සහ කිරීමයි.
(4) අන් අයගේ දියුණුව දැක සතුටු වීමයි.

(07) නිවැරදි දිසා නමස්කාරය පැහැදිලි කිරීම සඳහා බුදුරජාණන් වහන්සේ දේශනා කළ සූත්‍රය වන්නේ,
(1) පරාභව සූත්‍රය යි.
(2) වසල සූත්‍රය යි.
(3) සිගාලෝවාද සූත්‍රය යි.
(4) කරණීය මෙත්ත සූත්‍රය යි.

(08) බුදු දහමට අනුව කායික රෝග පිළිබඳ ඉගැන්වෙන සූත්‍ර දේශනාවක් වන්නේ,
(1) මහා මංගල සූත්‍රය යි.
(2) සිංසපා සූත්‍රය යි.
(3) අරියපරියේසන සූත්‍රය යි.
(4) ගිරිමානන්ද සූත්‍රය යි.

(09) දුගී පවුලක උපත ලැබුව ද ඉහළ මට්ටමේ රූප ශෝභාව හේතුවෙන් වාසනාවන්ත ජීවිතයක් ගත කිරීමට අවස්ථාව උදාවීම,

(1) උපධි සම්පත්තිය නමින් හඳුන්වයි.
(2) ගති සම්පත්තිය නමින් හඳුන්වයි.
(3) කාල සම්පත්තිය නමින් හඳුන්වයි.
(4) ප්‍රයෝග සම්පත්තිය නමින් හඳුන්වයි.

(10) " තණ්හාව ඇති කල්හි දුක ඇත. " මෙම ස්වභාවය පහදා දෙන හේතුඵල දහමේ මූල සූත්‍ර පාඨය,

(1) " ඉමස්මිං සති ඉදං හෝති " යන්නයි.
(2) " ඉමස්මිං අසති ඉදං න හෝති " යන්නයි.
(3) " ඉමස්ස උප්පාදා ඉදං උප්පජ්ජති " යන්නයි.
(4) " ඉමස්ස නිරෝධා ඉදං නිරුජ්ඣති" යන්නයි.

(11) ඇතිවීම් හා නැතිවීම් හේතුවෙන් හටගන්නා දුක බුදු දහමෙහි හඳුන්වනු ලබන්නේ,

(1) දුක්ඛ දුක්ඛතා යනුවෙනි.
(2) සංඛාර දුක්ඛතා යනුවෙනි.
(3) විපරිණාම දුක්ඛතා යනුවෙනි.
(4) දුක්ඛ ආර්ය සත්‍යය යනුවෙනි.

(12) බුදුරජාණන් වහන්සේ පාරිලෙය්‍ය වනයෙහි වැඩ වසමින් ඇතෙකුගේ හා වඳුරෙකුගේ උවටැන් ලබමින් ගත කළේ,

(1) දෙවන වස් කාලයයි.
(2) නෙවන වස් කාලයයි.
(3) දහවන වස් කාලයයි.
(4) සිව්වන වස් කාලයයි.

(13) පර්වත, වනාන්තර, ගල්ගුහා, දිය ඇලි, ගංගා ආදී සුන්දර පාරිසරික අංගවලට කිසිවිට බිය නොවන පුද්ගලයන් වන්නේ,

(1) විරාගි අයයි.
(2) සරාගි අයයි.
(3) වන සත්ත්ව සමූහය යි.
(4) දඩයමේ යන අයයි.

(14) ආහාර ගත් පසු ඇඳුම් ඇඳ ගැනීමට බැරි තරමට, ඇඳුම ගැනවත් නොසලකා ආහාර ගන්නා තැනැත්තා බෞද්ධ සාහිත්‍යයෙහි හඳුන්වා ඇත්තේ,

(1) භුත්තවමිතක යනුවෙනි.
(2) කාකමාසක යනුවෙනි.
(3) ආහාරහත්ථක යනුවෙනි.
(4) අලංසාටක යනුවෙනි.

(15) නිවැරදි ආහාර පරිභෝජනය පිළිබඳව බුදුන්වහන්සේ විසින් කොසොල් රජතුමාට දේශනා කළ සූත්‍රයක් වන්නේ,

(1) සිගාලෝවාද සූත්‍රයයි.
(2) කසීභාරද්වාජ සූත්‍රයයි.
(3) දෝණපාක සූත්‍රයයි.
(4) සතිපට්ඨාන සූත්‍රයයි.

(16) ක්‍රි. පූ. පළමු සියවසේ මාතලේ අලුවිහාරයේ දී ප්‍රාදේශීය නායකයෙකුගේ අනුග්‍රහය ඇතිව භික්ෂූන් වහන්සේ පන්සියනමකගේ සහභාගිත්වයෙන් පවත්වන ලද්දේ,

(1) ප්‍රථම ධර්ම සංගීතිය යි.
(2) දෙවන ධර්ම සංගීතිය යි.
(3) තුන්වන ධර්ම සංගීතිය යි.
(4) හතරවන ධර්ම සංගීතිය යි.

(17) වත්මන්හි ථූපාරාම සහ මහියංගණ යන චෛත්‍යයන්හි දක්නට ලැබෙන ස්තූප ආකෘතිය වන්නේ,

(1) පද්මාකාර හැඩයයි.
(2) ඝටාකාර හැඩයයි.
(3) ධාන්‍යාකාර හැඩයයි.
(4) ඝණ්ඨාකාර හැඩයයි.

(18) " අඩ්ඩචන්ද්‍රපාසාණ " යනුවෙන් හැඳින්වෙන්නේ,

(1) පියගැටපෙළයි.
(2) සඳකඩපහණයි
(3) කොරවක්ගලයි.
(4) මුරගලයි.

(19) පොළොන්නරුව යුගයේ විශාලතම බෞද්ධ කලාත්මක චිත්‍රාවලිය දක්නට ලැබෙන ස්ථානය වන්නේ,

(1) මහියංගණ පිළිමගෙයයි.
(2) තිවංක පිළිමගෙයයි.
(3) ජේතවනාරාම පිළිමගෙයයි.
(4) හිඳගල විහාරයයි.

(20) ශ්‍රී ලංකාවේ පැරණිතම සිංහල බෞද්ධ සාහිත්‍ය කෘති වශයෙන් සැලකෙන්නේ,

(1) සිහලට්ඨ කථා හෙවත් හෙළ අටුවා ය.
(2) ජාතක කථා සහ බුත්සරණ යන කෘතීන් ය.
(3) අමාවතුර සහ සිඛවළඳ විනිස යන කෘතීන් ය.
(4) ධර්ම ප්‍රදීපිකාව සහ අමාවතුර යන කෘතීන් ය.

(21) ගැමි හදවත් හඳුනාගත් ධර්මසේන හිමියෝ ගැමියන්ට බණ කීම සඳහා,

(1) පූජාවලිය නම් ග්‍රන්ථය රචනා කළහ.
(2) ධර්ම ප්‍රදීපිකාව නම් ග්‍රන්ථය රචනා කළහ.
(3) සද්ධර්ම රත්නාවලිය නම් ග්‍රන්ථය රචනා කළහ.
(4) සඟ සරණ නම් ග්‍රන්ථය රචනා කළහ.

(22) කෘෂි කර්මාන්තය ආදී නිෂ්පාදන කටයුතුවල නිරත බ්‍රාහ්මණ ගෘහපතීන්ට ධාර්මික රැකවරණය සැලසීම රටක ප්‍රධානියෙකු අනුගමනය කළයුතු කරුණක් ලෙස අවධාරණය කර ඇත්තේ,

(1) දස රාජ ධර්මවල ය.
(2) දස සක්විතිවත්වල ය.
(3) සතර සංග්‍රහ වස්තුවල ය.
(4) සතර බ්‍රහ්ම විහරණවල ය.

(23) සතර අගතියට අයත් කරුණක් නොවන්නේ,

(1) ප්‍රිය වචනයයි.
(2) ඡන්දය යි.
(3) ද්වේෂය යි.
(4) මෝහය යි.

(24) ත්‍රිවිධ රත්නය පිළිබඳ කරුණු දැන ඇති කර ගන්නා පැහැදීම හඳුන්වන්නේ,

(1) අමූලිකා ශ්‍රද්ධාව යනුවෙනි.
(2) ත්‍රිලක්ෂණ යනුවෙනි.
(3) සුපටිපන්න යනුවෙනි.
(4) අවෙච්චප්පසාදය යනුවෙනි.

(25) නිවන් මගෙහි ආරම්භය ශ්‍රද්ධාව වන අතර එහි අවසානය වන්නේ,

(1) සීලය යි.
(2) සමාධිය යි.
(3) භාවනාව යි.
(4) ප්‍රඥාව යි.

(26) සිල් රැකීමෙන් ලැබෙන ආනිසංස පහක් පිළිබඳව බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර ඇත. එම ආනිසංස අතරට අයත් නොවන්නේ,

(1). මහත් වූ භෝග සම්පත් අත්පත් කර ගැනීම යි.
(2) කීර්තිය පැතිරීම යි.
(3) සිහි මුලා වී කලුරිය කිරීමයි.
(4) මරණින් මතු සුගතියෙහි උපත ලැබීමයි.

(27) දාගැබ් කර්මාන්තයේ යෙදුන සියලු ම කාර්මිකයන්ට ආහාරපාන, ඇඳුම් පැළඳුම් හා වැටුප් පිරිනැමූ බව මහාවංශයේ සඳහන් වේ. එසේ සිදුකළ රජතුමා වන්නේ,

(1) දුටුගැමුණු රජතුමා ය.
(2) සද්ධාතිස්ස රජතුමා ය.
(3) කාවන්තිස්ස රජතුමා ය.
(4) දේවානම් පියතිස්ස රජතුමා ය.

(28) රිස් ඩේවිඩ්ස් වැනි මහා පඬිවරුන්ගේ ප්‍රධානත්වයෙන් පාලි ග්‍රන්ථ සමාගම (PALI TEXT SOCIETY) පිහිට වූ රට ,

(1) ශ්‍රී ලංකාව යි.
(2) ඉන්දියාවයි.
(3) අමෙරිකාවයි.
(4) එංගලන්තයයි.

(29) " සෞඛ්‍ය පහසුකම් සපයාදීම හා සුදුසු අවස්ථාවන්හි විවේක ලබාදීම " යන යුතුකම් දෙක ඉටු කළ යුත්තේ,

(1) ස්වාමියා විසින් බිරිඳට ය.
(2) බිරිඳ විසින් ස්වාමියාට ය.
(3) ස්වාමියා විසින් සේවකයාට ය.
(4) සේවකයා විසින් ස්වාමියාට ය.

(30) දුටුගැමුණු මහ රජතුමාගේ ප්‍රධානතම ශාසනික මෙහෙවර ලෙස සැලකෙන්නේ,
(1) තමා කළ පින් පොතක ලිවීමයි
(2) භික්ෂූන් වහන්සේලාට දන් දීමයි.
(3) ලෝවාමහා ප්‍රාසාදය ඉදිකිරීමයි.
(4) රුවන්වැලි මහා සෑය ඉදිකිරීමයි.

(31) කුරුණෑගල නිල්ලක්ගම පිහිටා ඇති කලාත්මක බවින් උසස් ම කලාංගය හඳුන්වන නාමය වන්නේ,
(1) සඳකඩපහණ යි.
(2) වාහල්කඩ යි.
(3) බෝධිඝරය යි.
(4) කොරවක් ගලයි.

(32) විපාක දෙන අනුපිළිවෙළ අනුව කර්මයේ ප්‍රභේද වන්නේ,
(1) ජනක, උපත්ථම්භක, උපපීඩක හා උපඝාතක යන කර්මයන් ය.
(2) දිට්ඨධම්මවේදනීය, උපපජ්ජවේදනීය, අපරාපරිය වේදනීය හා අහෝසි යන කර්මයන් ය.
(3) ගරුක, ආසන්න, ආචිණ්ණ හා කටත්තා යන කර්මයන් ය.
(4) ගති සම්පත්ති, උපධි සම්පත්ති, කාල සම්පත්ති හා ප්‍රයෝග සම්පත්ති ය.

(33) කට පාඩමින් රැගෙන ආ ධර්මය ග්‍රන්ථාරූඪ කරන ලද්දේ,
(1) පළමු ධර්ම සංගායනාවේදී ය.
(2) දෙවන ධර්ම සංගායනාවේදී ය.
(3) තුන්වන ධර්ම සංගායනාවේදී ය.
(4) අළුවිහාර ධර්ම සංගායනාවේදී ය.

(34) නිවන් මග යාමට අවශ්‍ය මග වියදම් සපයන උසස් ධනයක් මෙන් ම මිනිස් සිත් තුළ වැපිරිය යුතු බීජයක් ලෙස ද බුදු දහමෙහි පෙන්වා දෙන්නේ,
(1) ශ්‍රද්ධාව යි.
(2) ඉවසීම යි.
(3) කරුණාව යි.
(4) උපේක්ෂාව යි.

(35) පොළොන්නරු යුගයේ සිතුවම් දක්නට ලැබෙන ස්ථාන නිවැරදිව දැක්වෙන වරණය වන්නේ,
(1) සීගිරි පර්වතය හා දිඹුලාගල ලෙන් විහාරය යි.
(2) දිඹුලාගල ලෙන් විහාරය හා හිඳගල විහාරය යි.
(3) මහියංගණ ස්තූපයේ ධාතුගර්භය හා තිවංක පිළිම ගෙය යි.
(4) තිවංක පිළිම ගෙය හා ගෝනම් විහාරය යි.

(36) කනිෂ්ක රජුගේ අනුග්‍රහයෙන් සිදු කළ ධර්ම සංගායනාවේ දී ප්‍රධානත්වය ගනු ලැබුවේ.
(1) පාර්ශව තෙරුන් ය.
(2) වසුමිත්‍ර තෙරුන් ය.
(3) මහානාම තෙරුන් ය.
(4) සබ්බකාමී තෙරුන් ය.

(37) වයසට ගිය කල්හි පසු තැවීම, වයෝවෘද්ධ කොස්වාලිහිණියෙකු මසුන් නැති විලක් දෙස බලා සිටින්නාක් වැනි නිෂ්ඵල ක්‍රියාවක් බැව් අර්ථ ගැන්වෙන ධම්මපද ගාථා ධර්මය වන්නේ,
(1) සුකරානි අසාධුනි යනාදී ගාථාවයි.
(2) උට්ඨානවතො සතිමතො යනාදී ගාථාවයි.
(3) අචරිත්වා බ්‍රහ්මචරියං යනාදී ගාථාවයි.
(4) අත්තනාව කතං පාපං යනාදී ගාථාවයි.

(38) භාරතීය අලංකාර ශාස්ත්‍රය පදනම් කරගෙන නිර්මාණය වූ සිංහලයේ විශිෂ්ටතම මහා කාව්‍ය ලෙසින් හැඳින්වෙන්නේ,
(1) කව්සිළුමිණ නම් කාව්‍ය ග්‍රන්ථය යි.
(2) ලෝවැඩ සඟරාව නම් කාව්‍ය ග්‍රන්ථය යි.
(3) මුවදෙව්දාවත නම් කාව්‍ය ග්‍රන්ථය යි.
(4) සසදාවත නම් කාව්‍ය ග්‍රන්ථය යි.

(39) රත් වී උතුරමින් බුබුළු නැගෙන ජලයට උපමා කර ඇති නීවරණ ධර්මය වන්නේ,
(1) කාමච්ඡන්දය යි.
(2) ව්‍යාපාදය යි.
(3) ථීන මිද්ධය යි.
(4) විචිකිච්ඡාව යි.

(40) පුද්ගලයන් සාමයෙන් හා සහජීවනයෙන් ජීවත් වීමට නම් නොකළ යුතු කාර්යය වන්නේ,
(1) සියලුම ආගම් ඇදහීම යි.
(2) අන්‍යාගමික උත්සවවලට උදවු උපකාර කිරීමයි.
(3) අන්‍ය ආගමිකයන් සමඟ මතවාද ගැටුම් ඇති කර නොගැනීමයි.
(4) විවිධ ආගමික සංස්කෘතීන්ට ගරු කිරීම යි.

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

41105

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
Year End Evaluation

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper: II |
| කාලය / காலம் / Time: පැය 02 | | |

සැලකිය යුතුයි:

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- 02 වන ප්‍රශ්නයේ සිට 07 වන ප්‍රශ්නය දක්වා ප්‍රශ්නවලින් ඔබ කැමති ප්‍රශ්න 04ක් ද තෝරා ගෙන සම්පූර්ණ ප්‍රශ්න 05කට පිළිතුරු ලියන්න.

(01) (i) "මෙවන් පුතෙකු ලද මවක් පියෙක් නිවුණෝ වෙති" මෙම ප්‍රකාශය කළේ කවුද?

(ii) ශ්‍රද්ධාවේ මූලික ප්‍රභේද දෙක ලියන්න.

(iii) සේඛියා ධර්මවලට අනුව ආහාර පරිභෝජනයේ දී පිළිපැදිය යුතු යහපත් පුරුදු දෙකක් ලියන්න.

(iv) බුදුරජාණන් වහන්සේ ස්වභාවික පරිසරය දම්සභා මණ්ඩපයක් බවට පත් කරගත් අවස්ථා සඳහා උදාහරණ දෙකක් ලියන්න.

(v) දස අකුසලයෙහි දැක්වෙන කයෙන් සිදුවන අකුසල් දෙකක් ලියන්න.

(vi) බෞද්ධ පාලකයෙකු විසින් අනුගමනය කළ යුතු බෞද්ධ දේශපාලන මූල ධර්ම දෙකක් ලියන්න.

(vii) " භාවේති කුසල ධම්මෙ ආසේවති වඩ්ඪේති ඒතායතාති භාවනා " යන පාඨයේ සරල අදහස ලියන්න.

(viii) භාරතයේ පැවැත් වූ හතරවන ධර්ම සංගායනාව හඳුන්වන වෙනත් නම් දෙකක් ලියන්න.

(ix) දරුවන්ගෙන් දෙමව්පියන්ට ඉටුවිය යුතු යුතුකම් අතරින් 02ක් ලියන්න.

(x) පොළොන්නරු යුගයට අයත් සාහිත්‍ය කෘති දෙකක් නම් කරන්න.

ලකුණු (2 × 10 = 20)

(02) (1) තෙරුවන් නම් කරන්න.

(2) නව අරහාදි බුදුගුණ අතරින් "අරහං" බුදු ගුණය කෙටියෙන් හඳුන්වන්න.

(3) තෙරුවන් නැමදීම තුළින් සාර්ථක ගිහි ජීවිතයකට ලැබෙන පිටුබලය පැහැදිලි කරන්න.

ලකුණු (2 + 3 + 5 = 10)

(03) (1) බෞද්ධ කර්ම සංකල්පය සරලව හඳුන්වන්න.

(2) විපාක දෙන කාලය අනුව කර්මයේ ප්‍රභේද හතරකි. ඉන් තුනක් ලියන්න.

(3) අකුසල කර්මවලින් වැළකී කුසල කර්මවල යෙදීමෙන් පුද්ගලයාගේ දෙලොව දියුණුව සලසාගත හැකි ආකාරය පහදන්න.

ලකුණු (2 + 3 + 5 = 10)

(04) (1) "උට්ඨානවතෝ සතිමතෝ" ගාථාව සම්පූර්ණ කරන්න.

(2) එම ගාථාවේ සරල අදහස ලියන්න.

(3) එම ගාථාවේ සඳහන් ධර්ම කරුණු ඇසුරෙන් ශිෂ්‍ය ජීවිතයේ දියුණුව වර්ධනය කරගත හැකි ආකාරය පෙන්වා දෙන්න.

ලකුණු (2 + 3 + 5 = 10)

(05) (1) සිව්වන ථේරවාදී ධර්ම සංගීතිය හැඳින්වීමට සුදුසු නම් දෙකක් ලියන්න.

(2) සිව්වන ථේරවාදී ධර්ම සංගායනාව පැවැත්වීමට බලපෑ හේතු තුනක් සඳහන් කරන්න.

(3) ථේරවාදී බුදු දහමේ පැවැත්මට මෙම ධර්ම සංගායනාව කොතෙක් දුරට වැදගත් වූයේ දැයි විස්තර කරන්න.

ලකුණු (2 + 3 + 5 = 10)

(06) (1) ගර්භයේ හැඩය අනුව ස්තූපය ප්‍රධාන වශයෙන් බෙදා දැක්විය හැකි ආකාර දෙකක් ලියන්න.

(2) ස්තූපයක රූප සටහනක් ඇඳ එහි කොටස් තුනක් නම් කරන්න.

(3) ස්තූපය හා එහි අංග නිර්මාණයේ දී අතීත කලා ශිල්පීන් දැක් වූ කුසලතාවය ඇගයීමට ලක් කරන්න.

ලකුණු (2 + 3 + 5 = 10)

(07) පහත සඳහන් මාතෘකා අතරින් දෙකකට පමණක් කෙටි සටහන් ලියන්න.

(01) වැලිවිට අසරණ සරණ සිරි සරණංකර සංඝරාජ මාහිමි

(02) බෝධිසර

(03) සහජීවනය

(04) නිරෝගීකම

ලකුණු (5 + 5 = 10)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2022 (2023 මාර්තු)
**Year End Evaluation**

පිළිතුරු පත්‍රය
**Marking Scheme**

ශ්‍රේණිය / தரம் / Grade: 11
විෂයය / பாடம் / Subject: බුද්ධ ධර්මය
පත්‍රය / வினாத்தாள் / **Paper**: **I, II**

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| (01) | 2 | (11) | 1 | (21) | 4 | (31) | 1 |
| (02) | 3 | (12) | 3 | (22) | 2 | (32) | 4 |
| (03) | 3 | (13) | 1 | (23) | 1 | (33) | 1 |
| (04) | 2 | (14) | 2 | (24) | 4 | (34) | 2 |
| (05) | 2 | (15) | 2 | (25) | 3 | (35) | 3 |
| (06) | 4 | (16) | 3 | (26) | 3 | (36) | 2 |
| (07) | 1 | (17) | 4 | (27) | 2 | (37) | 3 |
| (08) | 2 | (18) | 3 | (28) | 2 | (38) | 1 |
| (09) | 3 | (19) | 1 | (29) | 3 | (39) | 1 |
| (10) | 3 | (20) | 1 | (30) | 2 | (40) | 4 |

## II පත්‍රය

(01) (i) 10 ශ්‍රේණිය පෙළපොත 94 හා 95 පිටු.

(ii) 10 ශ්‍රේණිය පෙළපොත 92 පිටුව.

(iii) නීති ශාස්ත්‍රය, කඩු ශිල්පය, දුනු ශිල්ප, ඇතුන් හැසිරවීම, අශ්වයන් හැසිරවීම ආදිය.
(10 ශ්‍රේණිය පෙළපොත 01 පිටුව)

(iv) කාමච්ඡන්ද, ව්‍යාපාද, ථීනමිද්ධ, උද්ධච්ච කුක්කුච්ච, විචිකිච්ඡා.

(v) රුවන්වැලි මහා සෑය / මිරිසවැටි දාගැබ

(vi) දොන් ඩේවිඩ් හේවාවිතාරණ සහ සිරි දේවමිත්ත ධර්මපාල හිමි.

(vii) සමථ / සමාධි / චිත්ත භාවනාව සහ විදර්ශනා / විපස්සනා / ප්‍රඥා / ත්‍රිලක්ෂණ භාවනාව.

(viii) කීකරු බව, කාරුණික බව, උගන්වන දේ හොඳින් ධාරණය කර ගැනීම, මෙත් සිතුවිලිවලින් යුක්ත වීම, නිර්භීත බව, අන් අය තලා පෙළා නැගී නො සිටීම, වයසට ගැළපෙන දේ පමණක් කිරීම, දෙමාපියන්ට අගෞරවයක් වන දේ නො කිරීම, ධනය බලය හා රාජ බලයෙන් උදම් නොවීම, විමසුම් නුවණින් කටයුතු කිරීම. (10 ශ්‍රේණිය පෙළපොත 02 පිටුව)

(ix) 11 ශ්‍රේණිය පෙළපොත 11 හා 12 පිටු. එම ගුණයට අදාළ ව ඕනෑ ම නිදසුන් දෙකක්.

(x) පාරමිතා, උප පාරමිතා, පරමත්ථ පාරමිතාව.

(02) (i) තංච කම්මං කතං සාධු - යං කත්වා නානුතප්පති
යස්ස පතීතො සුමනො - විපාකං පටිසෙවති

(ii) යමක් කිරීමෙන් පසුතැවෙන්නට සිදු නොවේ ද යමක විපාකය ප්‍රීතියෙන් හා සොම්නසින් යුතුව විඳිය හැකි වේ ද එබඳු ක්‍රියාවන්හි නිරත විය යුතු ය.

(iii) ප්‍රශ්නයට අදාළ ව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(03) (i) සිතේ කුසල් දහම් වැඩි දියුණු කරන මානසික අභ්‍යාසය භාවනාවයි.

(ii) රාග චරිත, දෝස චරිත, මෝහ චරිත, සද්ධා චරිත, බුද්ධි චරිත, විතර්ක චරිත.
(11 ශ්‍රේණිය 4 පාඩම 37 පිටුව)

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(04) (i) කුසල කර්ම සහ අකුසල කර්ම.

(ii) දිට්ඨධම්මවේදනීය කර්ම, උපපජ්ජවේදනීය කර්ම, අපරාපරියවේදනීය කර්ම, අහෝසි කර්ම.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(05) (i) මහා කාශ්‍යප මහරහතන් වහන්සේ, මගධයේ රජගහ නුවර වේභාර කඳු පාමුල සප්තපර්ණි ගල් ගුහාවේදී ය.

(ii) විසිරී තිබුණු ධර්ම විනය එක්රැස් කර සම්මුතියකට ගෙන ඒම, ධර්ම විනය කොටස් කර භාණක පරපුරකට පැවරීම, නව විනය නීති නොපැන වීමට ත් පැන වූ විනය නීති ආරක්ෂා කිරීමට ත් ප්‍රතිඥා දීම.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(06) (i) පිළිගත හැකි ඕනෑ ම සිදුවීම් දෙකක් ලියා ඇත්නම් ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(ii) 10 ශ්‍රේණිය පෙළ පොත 90 පිටුව. එහි සඳහන් ඕනෑ ම නිදසුන් දෙකක්.

(iii) ප්‍රශ්නයට අදාළව ලියා ඇති පිළිතුරට අනුව ප්‍රමාණවත් ලකුණු පිරිනමන්න.

(07) මාතෘකා දෙකකට අදාළව ලියා ඇති පිළිතුරු වලට අනුව ප්‍රමාණවත් ලකුණු පි රිනමන්න.


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
G.C.E. O/L
විද්‍යාව
A9+
ඉංග්‍රීසි භාෂාව
ENGLISH LANGUAGE
සිංහල
G.C.E. O/L SINHALA
General English
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
සමනල දැනුම
විභාග ඉලක්ක ජයගන්න
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON
DELIVERY
HOME
DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via
WhatsApp
071 777 4440

2022.06.07

# 6 ශ්‍රේණිය සිට 11 ශ්‍රේණිය දක්වා බස්නාහිර පළාත් පසුගිය විභාග ප්‍රශ්නෝත්තර පොත්වල නව මිල

## බස්නාහිර පළාත්

### 6 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 780/- |
| විද්‍යාව | 780/- |
| සිංහල | 780/- |
| ඉතිහාසය | 780/- |
| බුද්ධ ධර්මය | 780/- |
| දෙවන බස - දෙමළ | 780/- |
| English | 780/- |
| Mathematics | 780/- |
| Science | 780/- |

### 7 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 780/- |
| විද්‍යාව | 780/- |
| සිංහල | 780/- |
| ඉතිහාසය | 780/- |
| බුද්ධ ධර්මය | 780/- |
| දෙවන බස - දෙමළ | 780/- |
| නාට්‍ය හා රංග කලාව | 480/- |
| English | 780/- |
| Mathematics | 780/- |
| Science | 780/- |

### 8 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 780/- |
| විද්‍යාව | 780/- |
| සිංහල | 780/- |
| ඉතිහාසය | 780/- |
| බුද්ධ ධර්මය | 780/- |
| දෙවන බස - දෙමළ | 780/- |
| English | 780/- |
| Mathematics | 780/- |
| Science | 780/- |

### 9 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 780/- |
| විද්‍යාව | 780/- |
| සිංහල | 780/- |
| ඉතිහාසය | 780/- |
| බුද්ධ ධර්මය | 780/- |
| දෙවන බස - දෙමළ | 780/- |
| සෞඛ්‍යය | 480/- |
| English | 780/- |
| Mathematics | 780/- |
| Science | 780/- |

### 10 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 1080/- |
| විද්‍යාව | 1080/- |
| සිංහල | 1080/- |
| ඉතිහාසය | 1080/- |
| බුද්ධ ධර්මය | 1080/- |
| ව්‍යාපාර හා ගිණු.අධ. | 1080/- |
| තොරතුරු හා සන්. තා. | 1080/- |
| English | 1080/- |
| Mathematics | 1080/- |
| Science | 1080/- |

### 11 ශ්‍රේණිය

| | |
|---|---|
| ගණිතය | 1080/- |
| විද්‍යාව | 1080/- |
| සිංහල | 1080/- |
| ඉතිහාසය | 1080/- |
| බුද්ධ ධර්මය | 1080/- |
| ව්‍යාපාර හා ගිණු.අධ. | 1080/- |
| English | 1080/- |
| Mathematics | 1080/- |
| Science | 1080/- |